# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 5 දරන
# මාර්ග සංවර්ධන අධිකාරිය
# (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මාර්තු මස 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1988 අංක 5 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත

**[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]**

එල්. ඩී.—ඕ. 24/85

**දැනට මහාමාර්ග දෙපාර්තමේන්තුව සතු වී ඇති බලතල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, මාර්ග සංවර්ධන අධිකාරිය පනතට ආනුෂංගික සංශෝධන කිරීම සහ ඊට සම්බන්ධ හෝ එහිලා පැන නැඟෙන කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 5 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

### 1 වන කොටස

2. මේ පනත බලාත්මක වූ විට හා ඉන් පසු— මහාමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ වැඩ අධ්‍යක්ෂවරයාගේ දෙපාර්තමේන්තුවේ බලතල, කර්තව්‍ය හා කාර්ය, 1981 අංක 73 දරන පනතින් පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු හා ඉටුකළ යුතු බව.

(අ) මේ පනත බලාත්මක වීමට පෙරාතුව මංමාවත් ආඥාපනත අදාළ වූ සියලු පාරවල් සහ මංමාවත්, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද (මෙහි මින්මතු 'අධිකාරිය' යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරෙන්නේ ය;

(ආ) මංමාවත් ආඥාපනත මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ මහාමාර්ග දෙපාර්තමේන්තුවට හෝ වැඩ අධ්‍යක්ෂවරයාගේ දෙපාර්තමේන්තුවට පවරා ඇති හෝ නියම කර ඇති නැතහොත් භාරකර ඇති සෑම බලයක්, කාර්යයක් හා කර්තව්‍යයක් ම අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය; තවද

(ඇ) මංමාවත් ආඥාපනත මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ මේ කොටසේ උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් නිලධරයකු වෙත පවරා ඇති හෝ නියම කර ඇති නැත හොත් භාරකර ඇති සෑම බලයක්, කාර්යයක් හා කර්තව්‍යයක් ම ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

3. අධිකාරියේ අරමුදලින් පාරක් නඩත්තු කරනු ලැබේ නම්, ඒ පාර අධිකාරිය භාරයේ ඇත්තාක් සේ මංමාවත් ආඥාපනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, යම් පාරක් අධිකාරිය විසින් නඩත්තු කරන බවට එහි සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සනින් යුත් සහතිකයක් ඒ පාර එසේ නඩත්තු කරන බවට මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. අධිකාරියේ අරමුදලින් පාරක් නඩත්තු කරනු ලැබේ නම් ඒ පාර අධිකාරිය භාරයේ ඇත්තාක් සේ සැලකිය යුතු බව.

2—ඒ 101439—7,235 (88/02)

## උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| අධ්‍යක්ෂ | සාමාන්‍යාධිකාරී |
| අධිකාරී ඉංජිනේරුවරයා | ප්‍රධාන ඉංජිනේරුවරයා |
| ප්‍රධාන ඉංජිනේරුවරයා | ප්‍රධාන ඉංජිනේරුවරයා |
| විධායක ඉංජිනේරුවරයා | විධායක ඉංජිනේරුවරයා |
| අධ්‍යක්ෂ විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබූ ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හැර මහාමාර්ග දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු | බලාත්මක කිරීමේ නිලධරයා |

## II වන කොටස

1981 අංක 73 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) වෙනත් කවර හෝ නීතියක් මගින් අධිකාරිය වෙත පවරා ඇති හෝ නියම කර ඇති නැතහොත් භාරකර ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, අධිකාරිය විසින් ක්‍රියාත්මක කළහැකි සහ ඉටු කළහැකි බව, සැක දුරු කිරීම සඳහා, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියෙහි සඳහන් "මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය" යන වචන වෙනුවට, "මේ පනත මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ අධිකාරිය වෙත පැවරී ඇති හෝ නියම කර ඇති නැතහොත් භාරකර ඇති ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.